# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2359/41 – 2023 නොවැම්බර් මස 24 වැනි සිකුරාදා – 2023.11.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ විනෝද බදු පැනවීම

(267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ 2023.03.16 වන දින පැවති මහා සභා රැස්වීමේ තීරණ අංක 05.04 යටතේ සම්මත කරන ලද පහත සඳහන් යෝජනාව ඉහත කී විනෝද බදු ආඥාපනතේ දෙවන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලලිත් යූ. ගමගේ වන මා විසින් අනුමත කරන ලද බවට එකී උපවගන්තිය අනුව මෙයින් පළකරනු ලැබේ.

නීතිඥ ලලිත් යූ. ගමගේ,
ආණ්ඩුකාරවර,
මධ්‍යම පළාත.

2023 ජූලි මස 11 වැනි දින,
ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ අංක 2(1) වගන්තියෙන් හා 1984 අංක 37 දරන විනෝද බදු සංශෝධන පනත අනුව හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විනෝද බදු අයකිරීම සඳහා ප්‍රවේශ පත්‍රයේ මුද්‍රිත වටිනාකමින්,

| | | |
|---|---|---|
| රු. 10.00 සිට රු. 100.00 දක්වා | - | 5% |
| රු. 101.00 සිට රු. 500.00 දක්වා | - | 10% |
| රු. 501.00 සිට රු. 1000.00 දක්වා | - | 15% |
| රු. 1001.00 සිට ඉහළ | - | 20% |

විනෝද බද්දක් අය කිරීම සඳහා සහා අනුමැතිය ලබාදීම සුදුසු බවටත්, ඒ සඳහා පළාතේ පළාත් පාලන ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමට සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කර සිටිමි.

EOG 11 – 0214

1A – PG6556 – 11 (2023/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*